# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 14
NUMBER 03

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JUNE 10, 2011 ජුනි මාසය (බුද්ධ වර්ෂ 2555 පොසොන් මාසය)    http://www.lankaheritage.com/lankaviththi/


# සිදුවීම් රැසක් තුළ අපේ නොදැක්ම

**කීර්ති ජයසුන්දර විසිනි**

## දරුස්මාන් වාර්තාව සහ ඊට ශ්‍රීලංකා රජයේ ප්‍රතිචාරය

**මා**සයකට දෙකකට ඉහත එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන්කි මූන් ශ්‍රීලංකාවේ යුද අපරාධ තොරතුරු සොයාබලා තමාට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස තුන් දෙනෙකුගේ කමිටුවක් පත් කළේය. ඒ කමිටුව මණ්ඩලයේ අනුමැති යෙන් පත් කළ එකක් නොව තනිකරම බැන්කි මූන්ගේ උවමනාවට කරන ලද්දකි. කමිටුවේ තුන්දෙනා නම් ඉන්දුනීසියාවේ හිටපු ඇටර්නි ජෙනරාල් කෙනෙකු වූ මර්සුකී දරුස්මාන්, ඇමරිකාවේ නීතිවේදියෙකු වූ ස්ටීවන් රට්නර් සහ දකුණු අප්‍රිකාවේ සිවිල් අයිතිවාසිකම් අංශයේ වැඩකර ඇති යස්මින් සූකා නම් කාන්තාවය. මොවුන් තිදෙන එක්ව ශ්‍රී ලංකාව ගැන සැපයූ රපෝර්තුව **දරුස්මාන් වාර්තාව** යනුවෙන් හැඳින් වෙයි.

දරුස්මාන් වාර්තාව නිකුත් වූ විගස ශ්‍රීලංකාවේ හැමෝම වාගේ ඒ ගැන ඉතා උනන්දුවෙන් නොයෙක් දේ කතාකරමින් සාකච්ඡාකරන්නට වූහ. විශේෂයෙන් අපේ දේශපාලනඥයෝ ද දුරදිග නොබලා තම හිතට එන නොයෙක් මත ප්‍රකාශකරන්නට වූහ. එහෙත් ඒ කිසිවෙකු අමතක කළ හෝ නොදත් කාරණයක් නම් දැන් මේ ක්‍රීඩාව සෙල්ලම් කළ යුත්තේ ලංකාව තුළ ඉඳගෙන නොව කොටි හිතවාදී කණ්ඩායම්, දෙමළ ඩයස්පෝරාව හා ලංකා විරෝධී බටහිර රටවල්ද දැන් ක්‍රියාත්මක වන පිනීවාවලට ගොස් බවය. දරුස්මාන් වාර්තාව ගැන ලංකාව තුළට වී කෑගසා පලක් නැත. අපේ විදේශ අමාත්‍යංශය සහ එයට සම්බන්ධ විද්වතුන් ඔවුන්ගේ සියළු උත්සාහයන් යෙදිය යුත්තේ පිනීවාහි මානව හිමිකම් මණ්ඩලය තුළ ප්‍රතික්‍රියාවක් ඇතිවන අන්දමේ කටයුතු සහ ඊට සුදුසු පිරිස් වහ වහා සංවිධානය කිරීමය.

උදාහරණයක් වශයෙන් දැන් මේ දිනවල පිනීවාහි සාමාජික රටවල් 47 ක් එක්වී ලංකාවේ ප්‍රශ්නය සාකච්ඡා කරති. එය මේ මස 23 වෙනිදා දක්වා යයි. ඇම්නෙසිටි ඉන්ටර් නැෂල්, මානව හිමිකම් විමසුම් පර්ෂදය ඇතුළුව බොහෝ ජාත්‍යන්තර සංවිධානද, කොටිහිතවාදී ජාත්‍යන්තර දෙමළ ඩයස්පෝරාවද, ඇමරිකාව, එංගලන්තය ඇතුළු බටහිර රටවල්ද ඒකරාශිව මේ දිනවල පිනීවාහි උදේ දවල් හවස යන කාල තුනෙහිම ශ්‍රීලංකාවට එරෙහිව යුහුසුළුව කටයුතු කරති. ඔවුන් එකතුවී කරන්නේ දරුස්මාන් වාර්තාවේ සඳහන් කර ඇති සම්පූර්ණ අසත්‍ය, එමෙන්ම සිතාමතා ගොතන ලද පුවත් හා කටකතා තව තවත් තහවුරු කිරීමය.

## අසතුටුදායක අපේ විදේශ අමාත්‍යංශය

අපට පැහැදිලිව පෙනෙන දෙයක් නම්, මේ දරුස්මාන් වාර්තාව ප්‍රකාශකරන අසත්‍යවූත්, නොගැලපෙන වූත් කාරණා පිළිබඳව පිනීවාහි කතාබහට එක්වී සිටින රටවල් දැනුම්වත් කරන්නට ශ්‍රීලංකාවේ විදේශ අමාත්‍යංශය තුළින් එතරම් දෙයක් සිදුවී නැති බවයි. දරුස්මාන් කමිටුව පත්කළේ බැන්කි මූන් සහ නවීපිල්ලේ නමැති ද්‍රවිඩ කාන්තාවද යන දෙදෙනා හවුලේ ය. ඔවුන් දෙදෙනා කොටි හිතවාදී සංවිධාන, දෙමළ ඩයස්පෝරාව, ඇමරිකාව හා බ්‍රිතාන්‍ය ආදී ශ්‍රීලංකාවට අහිතවත් රටවල සාක්කුවලට වැටී සිටින බව හොඳට පැහැදිලි කරුණකි. අපේ විදේශ තානාපති සේවයන් යොදවා පිටරටවල් දැනුවත් කරන්නට අපට තවම නොහැකිවීම කණගාටු වියයුතු දෙයකි. අපේ විදේශ අමාත්‍යංශයේ කටයුතු ගැන සෑහීමකට පත්විය නොහැක්කේ එබැවිනි.

## ත්‍රස්තවාදය පරාජයකිරීමේ ලංකා අත්දැකීම් කියා පෑ කොළඹ සමුළුව

මේ සියල්ල අතරේ අපට අර්ථවත් යමක් කරගන්නට හැකිවීම ද එක් අතකට සිතට සහනයකි. සතුටකි. එනම් කොළඹ පැවැත්වූ රටවල් 40 කින් පමණ පැමිණි නිරීක්ෂක යින්ගෙන් සමන්විත සම්මන්ත්‍රණයයි. එහි මාතෘකාව වූයේ “ත්‍රස්තවාදය පරාජය කිරීමේ ශ්‍රීලංකා අත්දැකීම්” ( Defeating Terrorism - The Sri Lankan Experience) යන්නයි.

මේ සම්මන්ත්‍රණයට සහභාගිවූ බොහෝ දෙනෙකු යුද්ධය හා සෘජුව සම්බන්ධ වූ අය වූ අතර, ඔවුන්ද පැවසූ බොහෝ කාරණා රැස්ව සිටි කාගේත් සිත්ගත් වැදගත් තොර තුරු වූයේය. එම සම්මන්ත්‍රණයේදී වාර්තා වූ වඩාත්ම වැදගත් කාරණය නම් එයට සහභාගිවූ කොළඹ ඇමරිකානු තානාපති කාර්යාලයේ යුද කටයුතු පිළිබඳ නිලධාරියා දැන් ශ්‍රීලංකාවට එල්ලවී ඇති සුදු කොඩි සිද්ධිය සම්බන්ධව එහිදී කළ ප්‍රකාශනයයි. ඔහු එය පැවසූයේ මෙසේය.

“මම 2008 සිට ශ්‍රීලංකාවේ ඉන්නවා. මානව හිමිකම් සංවිධානවල අය කියන දේවල් අනුව යමින් ශ්‍රීලංකාවේ යුද්ධයේ අවසාන කාලයේ වූ දේවල් ගැන සොයා බලද්දී මට මැනවින් පෙනුණේ ඔය සුදු කොඩි අරගෙන ආවාය කියන කතාව ඇත්ත වශයෙන්ම කියවුණේ කේ පී සහ නඩේසන් කියන කොටි හමුදාව වෙනුවෙන් කතාකළ දෙන්නගෙන් බවයි. ඒ දෙන්නාම අන්තිම අවස්ථාවෙ කොටි හමුදාව එක්ක ළඟම හිටිය අය නෙවෙයි. නිසා ඒ කියුම් අපට එතරම් විශ්වාසවන්ත විදියට ගණන් ගන්න අමාරුයි.”

එසේ සුදු කොඩි කතාවේ සත්‍යවාදී බව ගැන සැක පහළකරමින් ඇමරිකානු නිලධාරියා කළ ඒ ප්‍රකාශනය නිසා දැන් ඇමරිකාව ඉතා අපහසු තත්වයකට පත්ව සිටියි.

කරුණු කාරණා මෙසේ වුවද ශ්‍රීලංකාව තවමත් සිටින්නේ යුද අපරාධ චෝදනා සම්බන්ධයෙන් අවදානම් තත්වයකය. මේ ගැන අප රජය වඩා සුපරීක්ෂාකාරී විය යුතුය. අන්තරාය හඳුනාගෙන කඩිනම්ව ඊට අවශ්‍ය ප්‍රතිකර්ම යෙදිය යුතුව ඇත. වහා ක්‍රියාත්මක වීමේ පුරුද්දක් අපට නැතිවීම සහ ස්වභාවයෙන් මන්දගාමී වීම අපට ඇති ලොකුම අවාසිය හා අවාසනාවය.

4 වන පිටුවට ⟶



A monk meditating at Chithurst Monastery, England. *Photograph*: Graham Harrison
*එංගලන්තයේ චිටිහර්ස්ට් ආශ්‍රමයේ භාවනාවේ යෙදී සිටින භික්ෂූන් වහන්සේ නමක්*

වසාගත් දෙනෙත කෙලෙසුන් නොඑන ලෙස
සිතාගත් අරමුණෙහි රැඳෙමින් නොලස
කසාවත් දරණ අපහට නොහැකි ලෙස
වතාවත් පුරණ ඔබ රසඳුනකි ඇස!

**Eyes firmly shut, so no defilements get in**
**The lucid mind focussed on the desired setting**
**Wrapped in yellow robes that we still cannot do**
**This is amazing discipline, for which we admire you!**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*





විස්තර පිටු අංක 3